**නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහනේ 2023 ජුනි 30 දිනෙන් අවසන් මාස හය සඳහා වූ ඒකාබද්ධ මුළු වියදම් ප්‍රකාශය**

------------------------------------------------------------------------------------------------------------------------

නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහනේ 2023 ජුනි 30 දිනෙන් අවසන් මාස හය සඳහා වූ ඒකාබද්ධ මුළු වියදම් ප්‍රකාශය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2014 මැයි 27 දින එළඹි අංක 3119 එස්ආර්අයි (එස්එෆ්) සහ 3120 එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුමේ සහ 2018 මැයි 11 දින එළඹි අංක 3650 එස්ආර්අයි (සීඕඑල්) සහ 3651 එස්ආර්අයි දරන අමතර ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.04(අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම , අරමුණු ,අරමුදල් යෙදවීම හා වැඩසටහනේ කාලය**

වැඩසටහනේ ණය ගිවිසුම අනුව, එවකට නිපුණතා සංවර්ධන සහ වෘත්තීය පුහුණු අමාත්‍යාංශය වර්තමානයේ අධ්‍යාපන අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ ආයතනය වන අතර සහ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය 11 පවතී. ගුණාත්මකභාවය, අදාළත්වය, ප්‍රවේශය, වෘත්තීය පුහුණුව සඳහා වන පිළිගැනීම සහ ආධාරක ප්‍රතිපත්ති, පද්ධති සහ ව්‍යුහයන් වැඩිදියුණු කිරීම මගින් දේශීය හා විදේශීය ශ්‍රම වෙළඳපොළ ඉල්ලුම සපුරාලීම සඳහා කාර්යක්ෂම නිපුණතා අධ්‍යාපන පද්ධතියක් ගොඩනැගීම වැඩසටහනේ අරමුණු වේ.ණය ගිවිසුම අනුව, වැඩසටහනේ මුළු පිරිවැය රු.මිලියන 141,524කට සමාන එ.ජ.ඩො මිලියන 1,061.2ක් වන අතර ඉන් රු.මිලියන 28,708.23කට සමාන එ.ජ.ඩො මිලියන 200ක් මුල්‍යනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව සහ රු.මිලියන 13,100කට සමාන එ.ජ.ඩො මිලියන 100ක් ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකග වී තිබුණි. ඉතිරි මුදල වූ එ.ජ.ඩො මිලියන 761.2 ජර්මන් රජය, කොරියන් එක්සිම් බැංකුව, වෙනත් සහ ශ්‍රී ලංකා රජය මුල්‍යනය කරන ලදි. වැඩසටහන එහි කටයුතු 2014 සැප්තැම්බර් ආරම්භ කරන ලද අතර 2021 ජුනි නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව, 2023 ජුනි 30 දක්වා දෙවතාවක් දීර්ඝ කර තිබුණි.

**1.3 මතය**

2023 ජුනි 30 දිනට නියෝජිතායතන 11 හි මූල්‍ය ප්‍රකාශනවල සපයා ඇති තොරතුරු සමඟ නිපුණතා අංශික සංවර්ධන වැඩසටහනේ ඒකාබද්ධ මුළු වියදම් ප්‍රකාශය සමඟ එකඟ වූ අතර වැඩසටහනේ ඒකාබද්ධ මුළු වියදම් ප්‍රකාශය සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ ඒකාබද්ධ මුළු වියදම් ප්‍රකාශය විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 ඒකාබද්ධ මුළු වියදම් ප්‍රකාශය පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම ඒකාබද්ධ මුළු වියදම් ප්‍රකාශය ආයතන 11හි මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති තොරතුරුවලට අනුකූලව සත්‍ය හා සාධාරණ ලෙස පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව ඒකාබද්ධ මුළු වියදම් ප්‍රකාශය පිළියෙල කිරීමට හැකිවනු පිණුස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයක් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

වැඩසටහනේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 ඒකාබද්ධ මුළු වියදම් ප්‍රකාශය විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස ඒකාබද්ධ මුළු වියදම් ප්‍රකාශය, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම ඒකාබද්ධ මුළු වියදම් ප්‍රකාශය පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් ඒකාබද්ධ මුළු වියදම් ප්‍රකාශය ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් ඒකාබද්ධ මුළු වියදම් ප්‍රකාශය ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් ඒකාබද්ධ මුළු වියදම් ප්‍රකාශය ඇතුළත් බව අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 වැඩසටහනේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

| | විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීමෙ | නිර්දේශ |
|---|---|---|---|
| **(අ)** | **රත්මලාන අත්තිඩිය නේවාසිකාගාර ගොඩනැගිල්ල ඉදිකිරීම** | | |
| (i) | අත්තිඩිය නේවාසිකාගාර ගොඩනැඟිල්ල ඉදිකිරීමේ අන්තර් ගෙවීම් සහතික අංක 23 අනුව, කොන්ත්‍රාත්කරු විසින් ප්‍රමාණ පත්‍රයේ සඳහන් රු මිලියන 66.81ක් වටිනා අයිතම 466ක කටයුතු ඉටුකර නොතිබුණු බව නිරීක්ෂණය විය. තවද, ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කිරීම සඳහා විශේෂ උපලේඛන මිල (SSR) යටතේ සිදු කරන ලද රු මිලියන 82.48ක් සහ ප්‍රමාණ පත්‍රයේ සඳහන් මිල (BOQ) යටතේ සිදු කරන ලද රු මිලියන 7.54කින් සමන්විත රු මිලියන 90.03 ක විචලතා පැවතුණි. | සංචාර සහ මහජන රැස්වීම සීමාකිරීම් සහිත කොවිඩ් සඳහා වසාදැමීම් කාලය හේතුවෙන් ප්‍රමාදයට එක් ප්‍රධාන හේතුවක් විය. මේ වන විට ඉදිකිරීම් අවසන් කර ලං.ජ.කා.අ.ආ (CGTTI) ආයතනය පවරා දී ඇත. | ඉදිකිරීම් පිරිවැය අවම කර ගැනීම සඳහා කොන්ත්‍රාත් පරිපාලන කටයුතු ශක්තිමත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) | අත්තිඩිය නේවාසිකාගාරයේ සුළං කවුළු 46ක් සවිකිරීම සඳහා රු මිලියන 1.99ක් වැඩිපුර ගෙවීමට සිදු වී ඇත. | මුල් සැලසුම වෙනස් කර ඇති අතර එම නිසා මෙම අයිතමය සඳහා නව මිල ගණන් භාවිත කර ඇත. | -එම- |
| **(ආ)** | **කිලිනොච්චියේ ශ්‍රී ලංකා ජර්මානු තාක්ෂණික පුහුණු ආයතනයේ නේවාසිකාගාර ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු**<br><br>2017 සැප්තැම්බර් 12 වැනි දින ගන්නා ලද කැබිනට් තීරණයට අනුව සිසුන් 400 දෙනෙකුට නේවාසික පහසුකම් සැලසීම සඳහා මහල් 3 කින් යුත් නව නේවාසිකාගාර ගොඩනැගිල්ලක් ඉදිකිරීමට රු මිලියන 253.8ක් වෙන් කරන ලද අතර 2020 මැයි 20 වන දින රු මිලියන 185.61 ක ඇස්තමේන්තුගත මුදලකට කොන්ත්‍රාත්තුවක් ලබා දී තිබුණි. පසුව, 2023 පෙබරවාරි 28 දින සංශෝධිත ඇස්තමේන්තුගත පිරිවැය රු මිලියන 120.14කට ගොඩනැගිල්ලේ පළමු මහල නිම කිරීම සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබුණි. පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ. | | |
| (i) | ජල සම්පාදන හා ජලාපවහන, විදුලිය සහ පවිත්‍රාගාරයට අදාළ කටයුතුවල දුර්වල ප්‍රගතිය හේතුවෙන් නේවාසිකාගාර ගොඩනැගිල්ලේ පළමු මහලේ නේවාසික පහසුකම් විගණන දිනය දක්වා ආධුනිකයන් වෙත ලබා දීමට නොහැකි විය. | ඉතිරි වැඩ 2024 ජූලි 15 දිනට පෙර අවසන් කරන ලෙස කොන්ත්‍රාත්කරුට උපදෙස් දී ඇත. තවද, සිසුන් සඳහා නේවාසික පහසුකම් 2024 ජූලි 3 වන දින ලබා දෙනු ඇත. | කොන්ත්‍රාත්කරුගේ කටයුතු අධීක්ෂණය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | අන්තර් ගෙවීම් සහතික 14 හි ප්‍රධාන සාරාංශයට අනුව 2022 අප්‍රේල් 12 දිනට සිදු කරන ලද සමුච්චිත වැඩ වටිනාකම රු. මිලියන 110.73ක් ලෙස සඳහන් විය. නමුත් එය රු මිලියන 114.71 ක් ලෙස අන්තර් ගෙවීම් සහතිකය 14හි මුහුණතෙහි දැක්විය. එබැවින්, මෙම අන්තර් ගෙවීම් සහතිකය යටතේ කොන්ත්‍රාත්කරුට රු මිලියන 3.58ක වැඩිපුර ගෙවීමක් කර තිබුණි. | මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශයේ ගෙවීම් සහතිකයට අනුව අන්තර් ගෙවීම් සහතික 14 හි ප්‍රධාන සාරාංශයේ රු මිලියන 110.73 වට්ටම් මිල වු අතර, රු මිලියන 114.71 සත්‍ය වශයෙන්ම සිදු කරන ලද වැඩ වේ IPC 14 සඳහා වට්ටම් මිල මිලියන 103.31 කි. | ගෙවීම් සිදු කිරීමට පෙර ඉටුකරන ලද කාර්යයේ නිරවද්‍යතාව තහවුරු කිරීමට කටයුතු කළ යුතුය. |
| **(ඈ)** | **වෘත්තීය පුහුණු අධිකාරියේ ඉදිකිරීම් කටයුතු** | | |
| (i) | 2016 වර්ෂයේ පොතුවිල්හි ඉවුම් පිහුම් පාඨමාලාව සඳහා රු. මිලියන 4.47ක් වටිනා පුහුණු උපකරණ ලබාගෙන තිබුණි. කෙසේවෙතත්, උපදේශකවරුන් නොමැතිකම හේතුවෙන් අදාළ පාඨමාලාව විගණනිත දිනය දක්වා ආරම්භ කර නොතිබුණි. එබැවින්, මෙම උපකරණ නිශ්කාර්ය පැවති අතර වගකීම් කාලයද අවසන් වී තිබුණි. | අදහස් දක්වා නොමැත | පුහුණු උපකරණ ඵලදායී ලෙස භාවිත කිරීමට පහසුකම් සැලසීමට කටයුතු කළ යුතුය. |
| (ii) | සිසුන් සඳහා පුහුණු අවස්ථා ලබා දීම සඳහා අහංගම හෝටල් පාසල හෝටලයක් ලෙස ප්‍රතිසංස්කරණය කිරීමේ සඳහා රු. මිලියන 162.18 ක් වැඩසටහන මගින් වැය කර තිබුණි. කෙසේවෙතත්, 2024 මැයි 10 වන දින වනවිටත් එවැනි පුහුණු වැඩසටහන් ආරම්භ කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත | වැඩසටහනේ අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |
| (iii) | අම්පාර සහ යාපනය දිස්ත්‍රික්කවල සංචාරකයින් වෙත ලබාදීමේ අරමුණින් වෘත්තීය පුහුණු අධිකාරියේ අරමුණුවලට පටහැනිව රු. මිලියන 91.03ක පිරිවැයකට හෝටල් කාමර 22ක් ඉදිකළ අතර මේ සඳහා රු. මිලියන 6.10ක් වටිනා ගෘහ භාණ්ඩ මිලදී ගන්නා ලද අතර 2017 වර්ෂයේ සිට නිශ්කාර්යව පැවතුණි. | අදහස් දක්වා නොමැත | තවදුරටත් ප්‍රමාදයකින් තොරව හෝටල් කාමර ප්‍රයෝජනවත් අයුරින් භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (iv) | ගොඩනැගිල්ලට ස්ථිර ජල සැපයුමක් ලබා ගැනීමට නොහැකි වීම හේතුවෙන් කුච්චිවේලි හෝටල් පාසලේ ආධුනිකයන් 52 දෙනෙකුට නවාතැන් ගැනීම සඳහා අංග සම්පූර්ණ කාමර 12 කින් සමන්විත රු. මිලියන 140.21ක පිරිවැයකට ඉදිකළ දෙමහල් නේවාසිකාගාර ගොඩනැගිල්ලක් 2017 වර්ෂයේ සිට වසර 06ක් පුරා නිශ්කාර්යව පැවතිණි. | අදහස් දක්වා නොමැත | තවදුරටත් ප්‍රමාදයකින් තොරව නේවාසිකාගාර ගොඩනැගිල්ල ප්‍රයෝජනවත් ආකාරයෙන් භාවිතා කිරීමට අවශ්‍ය පහසුකම් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ඇ)** | **ජාතික තරුණ සේවා සභාවේ ඉදිකිරීම් කටයුතු** | | |
| (i) | මොනරාගල, දඹුල්ල සහ ලව්ලේන් පුහුණු මධ්‍යස්ථානවල ඉදිකිරීම් කටයුතු පිළිවෙළින් සියයට 70ක් සහ සියයට 65ක් අවසන් කිරීමෙන් පසු කොන්ත්‍රාත්කරුවන් විසින් අත්හැර දමා තිබූ අතර ඒ වන විට වැඩසටහන මගින් රු. මිලියන | ලව්ලේන් පුහුණු පන්තිකාමර ගොඩනැගිල්ලේ බිම් මහලේ පන්ති පැවැත්වේ. ඉහළ මහලේ පන්තිකාමර හතරක වැඩ අවසන් කර ඇති අතර ඉතිරි වැඩ අවසන් කිරීමට ප්‍රතිපාදන | ඉදිකිරීම්වල ඉතිරි වැඩ අවසන් කිරීමට කඩිනම් පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 142.70 ක් වැය කර තිබුණි. කෙසේවෙතත්, ජාතික තරුණ සභාව විසින් කොන්ත්‍රාත් නැවත ප්‍රදානය කර 2023 ජුනි 30 වන විට ඉතිරි වැඩ අවසන් කර නොමැති බව නිරීක්ෂණය විය. | සැලසීමට නියමිතය. | |
| (ii) | වැඩසටහනේ අවසන් වාර්තාවට අනුව, ජාතික තරුණ සභාවේ ගොඩනැගිලි 5ක වැඩිදියුණු කිරීම සඳහා රු. මිලියන 535.78ක් ලබා දී ඇත. නමුත් එය රු. මිලියන 456.2ක් ලෙස අදාළ ආයතනයෙන් ලැබී ඇති තොරතුරුවල දැක්වේ. | ජාතික තරුණ සභාවේ රත්මලානෙහි වියදම දෙගුණයක් ගණන්ගෙන ඇති අතර එය රු. මිලියන 535.78 වී ඇත. අපගේ වාර්තාවට අනුව නිවැරදි මුදල රු. මිලියන 497.84 කි. | ඉදිකිරීම්වල නිවැරදි වටිනාකම හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ඉ)** | **කාර්මික විද්‍යාල සහ තාක්ෂණ විද්‍යාලයවල ඉදිකිරීම් කටයුතු** | | |
| (i) | වැඩසටහනේ අවසන් වාර්තාවට අනුව, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි 36ක වැඩිදියුණු කිරීම් සඳහා රු මිලියන 1,093.48 ක් ලබා දී තිබුණි. කෙසේවෙතත්, අදාළ ආයතනයෙන් ලැබුණු තොරතුරු අනුව, එය රු මිලියන 711.8 විය. | කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ පිළිතුරු අනුව, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව සඳහා දරන ලද මුළු වියදම රු. මිලියන 711.8 කි. නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහනේ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනවල ගොඩනැඟිලි ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වන ඇස්තමේන්තුවේ වටිනාකම හඳුනාගෙන ඇත.<br><br>කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ බණ්ඩාරවෙල, හසලක, රත්මලාන, වවුනියාව, කළුතර, වාරියපොල, සමන්තුරේ, නුවරඑළිය, පොළොන්නරුව, දඹුල්ල සහ මඩකලපුව යන මධ්‍යස්ථානවල වටිනාකම දෙගුණ වී ඇති අතර එය රු. මිලියන 1,093.48 වේ. | ඉදිකිරීම්වල නිවැරදි වටිනාකම හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ඊ)** | **විශ්වවිද්‍යාල විද්‍යායතන** | | |
| (i) | බටංගල විශ්වවිද්‍යාල විද්‍යායතනයේ ආගන්තුක සත්කාර කළමනාකරණ විද්‍යාගාරයේ නාන කාමරයක් ඉදිකිරීම සඳහා 2015 අගෝස්තු 24 වැනි දින වැඩසටහන මඟින් ලබා දුන් රු 464,400 ක් වටිනා නානකාමර උපාංග විගණනිත දිනය වූ 2024 මාර්තු 06 වන විටත් නිශ්කාර්යව පැවතුණි. | වර්තමානයේ ඉදිකිරීම් සිදුකරමින් පවතී. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව ඉදිකිරීම් කටයුතු කඩිනම් කිරීමට කටයුතු කළ යුතුයි. |
| (ii) | රත්මලාන විශ්වවිද්‍යාල විද්‍යායතනය මඟින් පවත්වනු ලබන පාඨමාලා සඳහා අදාළ නොවන රු මිලියන 1.45ක් වටිනා පොත් 591 වර්ෂ 9ක් පුරා නිශ්කාර්යව පැවතුණි. | අදහස් දක්වා නොමැත. | පොත්පත් ප්‍රයෝජනවත් අයුරින් පරිහරණය කිරීමට කටයුතු කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (iii) | රත්මලාන විශ්වවිද්‍යාල විද්‍යායතනයේ රූපවාහිනී පශ්චාත් නිෂ්පාදන තාක්ෂණ විද්‍යාගාරයේ (TV Post Production Technology) රු. 423,243ක් වටිනා මේස මයික්‍රෆෝනය 31 පැවතියද, එහි පාඨමාලා හදාරන සිසුන්ට අදාළ නොවීම හේතුවෙන් 2024 පෙබරවාරි 06 වැනි දින විගණන දිනය වන විටත් වර්ෂ 9ක් පුරා නිශ්කාර්යව පැවතුණි. | අදහස් දක්වා නොමැත. | උපකරණ ප්‍රයෝජනවත් ආකාරයෙන් භාව කිරීමට කටයුතු කළ යුතුය. |
| (iv) | වැඩසටහනේ අවසන් කිරීමේ වාර්තාවට අනුව, පාඨමාලා සඳහා අලුතින් සංවර්ධනය කරන ලද ජාතික නිපුණතා ප්‍රමිති (NCS) සහ විෂයමාලා 40ක් සහ සංශෝධිත ජාතික නිපුණතා ප්‍රමිති සහ විෂයමාලා 29ක් පැවතුණි. කෙසේවෙතත්, තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවෙන් ලැබුණු තොරතුරුවලට අනුව, සිසුන්ගේ ඉල්ලුමට සරිලන පාඨමාලා හඳුන්වා නොදීම, හඳුන්වා දෙන ලද පාඨමාලා සුදුසුකම්ලත් උපදේශකයින් නොමැතිකම සහ කර්මාන්ත අංශයේ නිපුණතා කවුන්සිලයේ දුර්වල මැදිහත්වීම් හේතුවෙන් කිසිදු ශිෂ්‍යයෙකු හැදෑරීමට සහභාගී නොවුණු පාඨමාලා 36ක් සහ සිසුන් 5ත් 78ත් අතර හදාරන පාඨමාලා 12ක් පැවතුණි. | කර්මාන්තයට අවශ්‍ය පරිදි කර්මාන්තය ඉල්ලා සිටින විට ජාතික නිපුණතා ප්‍රමිති සංවර්ධනය කරනු ලැබේ. පුහුණු පාඨමාලාව ක්‍රියාත්මක කිරීම අදාළ කර්මාන්තය විසින් සිදු කරනු ලැබේ. එබැවින්, සමහර ජාතික නිපුණතා ප්‍රමිති එම කර්මාන්තයේ අභිමතය පරිදි භාවිතා නොවේ. කර්මාන්ත අංශයේ නිපුණතා කවුන්සිල සෑම විටම ජාතික නිපුණතා ප්‍රමිති, විෂයමාලා සංවර්ධනයට සහ වලංගු කිරීමේ ක්‍රියාවලියේ සම්බන්ධ විය. | අදාළ ජාතික නිපුණතා ප්‍රමිතිය සහ විෂයමාලා හඳුන්වා දීමට කටයුතු කළ යුතුය. |

## 3.2 අභ්‍යන්තර පාලනය

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීමේ | නිර්දේශ |
|---|---|---|
| වැඩසටහනේ ක්‍රියාකාරකම් පිළිබඳව ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනයේ අභ්‍යන්තර විගණන අංශය විසින් අභ්‍යන්තර විගණනය සිදු කර නොතිබුණි. | නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන සඳහා සේවක සංඛ්‍යාව අනුමත කිරීම සඳහා 2021 ආරම්භයේදී සේවක සංඛ්‍යා සංශෝධනයක් සිදු විය. බොහෝ තනතුරු අනුමත කර නොමැත. අභ්‍යන්තර විගණක තනතුර ද ඒ අතර විය. කෙසවෙතත්, නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන අඩු සේවක සංඛ්‍යාවකින් ක්‍රියාත්මක වූ බැවින්, අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණකවරයා විසින් නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන ද විගණනය කරනු ඇතැයි අපි අපේක්ෂා කළෙමු. | අභ්‍යන්තර විගණනය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය මගින් සිදුකිරීමට කටයුතු කළ යුතුය. |